**පහත දැක්වෙනුයේ HNB Assurance පොදු සමාගමේ වාර්ෂික වාර්තාවේ පිටු අංක 31 - 35 හි සඳහන් සභාපතිතුමියගේ පණිවුඩයේ සිංහල පරිවර්තනයක් පමණි.**

## සභාපතිතුමියගේ පණිවිඩය

අප සමාගමේ පහළොස් වැනි මහ සභා රැස්වීමට ඔබ සියළු දෙනා පිළිගැනීමට ලැබීමත් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීමට ලැබීමත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා ලද භාග්‍යක් කොට සළකමි. පසුගිය වාර්ෂික මහ සභා රැස්වීමේ දී මා පොරොන්දු වූ ආකාරයට අප සමාගම විසින් සතුටුදායක ප්‍රතිඵල ළඟාකරගැනීමට දැඩි පරිශ්‍රමයක් දරා ඇති අතර මේ සඳහා පාදකවූයේ තිරසාර සංවර්ධනයක් ළඟාකරගැනීමට අවශ්‍ය මූලික කරුණු ඔස්සේ ක්‍රියාකිරීමයි.ඒ අයුරින් බලන විට 2016 වසරේ අපගේ කාර්යය සාධනය තුළ ප්‍රධාන කාරණා වන්නේ ලාභදායිත්වය සහ තිරසාරත්වයයි.

ඉතා තියුණු තරගකාරී පරිසරයක සහ ශ්‍රී ලංකාවටම බලපෑ විනාශකාරී ආපදා තත්වයන් හේතුවෙන් රු.මිලියන 880 කට අධික හිමිකම් ගෙවීමක් මධ්‍යයේ පවා අපගේ සමාජ සහ නෛතික වගකීම ඉටු කරමින් පසුගිය වසරට සාපේක්ෂව පිරිවැටුමේ 22% ක වර්ධනයක් සහ ලාභදායිත්වයේ 228% ක වර්ධනයක් ළඟා කර ගැනීමට 2015 වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී අප ට හැකි වී තිබේ.

<u>ආර්ථික පරිසරය - 'අභියෝගාත්මකය'</u>

වසර පුරාම පැවතුණ අහිතකර කාලගුණික තත්ත්වයන් නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇතිවූ 2.5% ක වර්ධනයේ අඩුවීම සහිත පසුබිම තුළ වසරකට පෙර තිබූ 5.6% සිට 4% දක්වා පළමු කාර්තු තුන තුළ ඇතිවූ වර්ධනයේ අඩුවීමත් සහිතව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2016 දී 5% ක් (2015 : 4.8%) වැනි මධ්‍යස්ථ අනුපාතයකින් වර්ධනය වනු ඇති බව ඇස්තමේන්තු කර ඇත. එම කාලය තුළම සේවා අංශය 4.8% ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා කර තිබෙන අතර කර්මාන්ත අංශය සාපේක්ෂ වශයෙන් 5.7% ක ආකර්ෂණීය වර්ධනයක් ළඟා කරගෙන තිබුණි. ආර්ථික වර්ධනය අඩුවෙමින් පවතින තත්වයක් තුළ අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩියෙන් පවතින ණය වැඩිවීම්වලට ප්‍රතිචාරයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අවස්ථා දෙකකදී මූල්‍ය අනුපාත වැඩි කරමින් සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාත 1.5% කින් වැඩි කරමින් වසර තුළ තම මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කර තිබුණි. කෙසේ වෙතත් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වෙනස්කම් මත වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කළ උද්ධමනය 2016 දෙසැම්බර් මස වන විට සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක එනම් 4.1% ක් ව පැවතුණි.

එම වසර තුළ ආර්ථිකයේ දළ නිල විදේශ සංචිතවල අඩුවීමක් පෙන්නුම් කළ අතර එයට ප්‍රධාන හේතුව වූයේ විශාල විදේශ ණය සේවා ගෙවීම් පැවතීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොලෙන් දළ විදේශ ආයෝජනයන් පිටතට ගලායාමය. කෙසේ වෙතත් අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් ගෙවුම් ශේෂය යහපත් කිරීම සඳහා ලබාදුන් විස්තෘත ණය පහසුකම හා රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය හේතුවෙන් ඇතිවූ ආයෝජකයන්ගේ ධනාත්මක ආකල්පය හේතුකොටගෙන 2016 මැද භාගය වනවිට එක්සත් ජනපද ඩොලර් බිලියන 5.3ක් දක්වා පහත බැස තිබුණු විදේශ සංචිත ප්‍රමාණයේ වර්ධනයක් දක්නට ලැබුනි.

මේ හේතුවෙන් රජයේ සුරැකුම්පත් වෙළඳපොලේ අරමුදල් පිටතට ගලායාම් ආපසු හැරීම, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වලින් ලද අරමුදල් හා සම්මිලිත ණය හේතුවෙන් දළ නිල විදේශ සංචිත ඇමරිකානු ඩොලර් බිලියන 6.5ක් දක්වා සැප්තැම්බර් අගවනවිට වැඩිවූ අතර වර්ෂ අවසාන වනවිට එය ඇමරිකානු ඩොලර් බිලියන 6ක් ව පැවතුනි.

විනිමය අනුපාත සැලකූ විට පසුගිය වසර සමග සැසඳීමේදී වසර පුරාම රුපියලේ අගය සාපේක්ෂ වශයෙන් ස්ථාවර මට්ටමක පැවතුණ අතර පසුගිය වසරේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 3.8% කින් අවප්‍රමාණය විය.

විස්තෘත ණය පහසුකම යටතේ එකඟ වූ ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ වන්නේ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව අරමුණු කරගත් නම්‍යශීලී උද්ධමනය, විදේශ විනිමය කළමනාකරණයේ දැඩි නම්‍යශීලීත්වය, රජයේ ආදායම වැඩිකර ගැනීම තුළින් අයවැය හිඟය අඩුකර ගැනීම සහ හඳුනාගත් අලාභ ලබන ආයතනවලින් රජය ඉවත්වීමත් ලෙස දැක්විය හැකිය. ආදායම පදනම් කරගත් මූල්‍ය ස්ථාවර කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දුන් ක්‍රියාමාර්ග රජයේ අදායම වර්ධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති අතර එමගින් රජයේ බදු ආදායම දළ වශයෙන් 15% කින් පමණ වර්ධනය කර තිබේ. 2016 අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5.5% ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

වසරේ පළමුවන භාගයේදී 27% ක් ලෙස තිබූ පෞද්ගලික අංශයේ ණය වර්ධනය වසරේ දෙවන කාර්තුවේදී එනම් ඔක්තෝබර් මාසයේදී 22% දක්වා අඩුවීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි කරන ලද මූල්‍ය ප්‍රතිපත්තිය ආන්තික වශයෙන් වුවද සාර්ථක බව පෙනී යයි. එමෙන්ම තවදුරටත් වාහනවල ආනයන බද්ද කිහිප අවස්ථාවක වැඩිකිරීම තුළ වාහන ආනයනයේ 25%ක පමණ අඩුවීමක් ඇතිවී තිබේ.

රාජ්‍ය පෞද්ගලික සම්බන්ධතා හරහා ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රජය වැඩි අවධානයක් දක්වා තිබෙන අතර පුද්ගලික අංශයේ ව්‍යාපෘති ගණනාවක් 2016 වසරේ දී ආරම්භ කිරීම තුලින් ඒවායේ යහපත් ප්‍රතිඵල 2017 වසරේ දී ලබා ගැනීමට බලාපොරොත්තු වේ. තවදුරටත් සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය 2017 අයවැය තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, අපනයන සහ ඉදිකිරීම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙවන් ප්‍රතිපත්ති තුළින්ද ජී එස් පී + (GSP+) පහසුකම නැවත ලබා ගැනීමට ඇති හැකියාව, යුරෝපයට මත්ස්‍ය අපනයන කිරීමේ තහනම ඉවත් කිරීම සහ සමහර ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල වර්ධනය වන ආර්ථික ක්‍රියාකාරකම් ද හේතුවෙන් අපනයන ක්ෂේත්‍රයේ කාර්යය සාධනය වර්ධනය වනු ඇති බව මගේ විශ්වාසයයි.

කෙසේ වෙතත් ආර්ථිකය පුරා සිදුවන බදු වැඩිකිරීම තුළින් පාරිභෝගිකයින්ගේ ක්‍රය ශක්තිය වෙත අහිතකර බලපෑම් එල්ල කෙරෙන අතර එතුළින් පෞද්ගලික අංශයේ අඩු ආදායම්වල ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජන අඩුවීම සිදුවේ. 2016 වර්ෂය තුළ මූල්‍ය ක්ෂේත්‍රය හරහා හඳුන්වාදුන් බහුවිධ ක්‍රියාමාර්ග තිබියදීත් රට 2017 වර්ෂයට පා නගන ලද්දේ දැඩි ණය බරක් සහිතව වන අතර එය රජයේ සියළු සංවර්ධන උත්සාහයන් ට බාධාවක් ව පවතී. තවද රටේ විවිධ ප්‍රදේශවලට මුහුණ දීමට සිදුවන නියඟය නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අඛණ්ඩ අහිතකර බලපෑමක් එල්ල විය හැකි බැවින් 2017 වසරේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයටද අහිතකර බලපෑමක් ඇතිවේයැයි අපේක්ෂා කෙරේ. අහිතකර කාළගුණය තුළ විදුලිය නිපදවීම සහ විදුලි මිල කෙරෙහිද අහිතකර බලපෑමක් එල්ල කරනු ඇත .

ගෝලීය ආර්ථිකය වර්තමානයේ සංක්‍රාන්තිමය කාලයක් පසු කරමින් සිටියි. 2017 වසරේ ලෝකයේ ප්‍රධාන රටවල් දෙකක මැතිවරණ පැවැත්වීමට නියමිතය. යුරෝපයේ සිදුවෙමින් පවතින ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස් වීම් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති වෙනස්වීම් විශේෂයෙන්ම ෆෙඩරල් සංචිතවල පොලී අනුපාත වැඩිවීමට ඇති හැකියාවත් සමඟ විදේශ පරිසරය තුළ අවිනිශ්චිත තත්ත්වයක් ඇති වී තිබේ.

මෙම අභියෝගාත්මක පරිසරය තුළ ශක්තිමත්ව නැගී සිටීම සඳහා රජය විසින් මනා ලෙස සම්බන්ධීකරණය කළ ස්ථාවර සහ පූර්ණ සංවර්ධනය අරමුණු කරගත් ප්‍රතිපත්ති කාර්යක්ෂමව සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් සහිතව ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ.

රක්ෂණ ක්ෂේත්‍රය - 'තරඟකාරී සහ ගතිකය'

ශ්‍රී ලාංකීය රක්ෂණ කර්මාන්තය අඩු වේගයකින් වුවද ධනාත්මක වර්ධනයක් වාර්තාකරමින් ප්‍රබල කර්මාන්තයක් බවට පත්වෙමින් පවතියි. 2014 වසරේ සිට දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට සරිලන පරිදි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අංශවල තියුණු වර්ධනයක් දක්නට ලැබේ. 2016 වසරේදී ජීවිත රක්ෂණ අංශයේ දළ ලේඛනගත වාරික ආදායම 19% ක වර්ධනයක් පෙන්වා ඇති අතර සාමාන්‍ය රක්ෂණ අංශයේ 14% ක වර්ධනයක් පෙන්වා තිබේ. ඒ අනුව සමස්ථ දළ ලේඛනගත වාරික ආදායම ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අංශ සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 63.6 ක් සහ රුපියල් බිලියන 76.6 ක් ලෙස වාර්තා වී තිබේ.කෙසේ වෙතත් මූල්‍ය ක්ෂේත්‍රයේ සමස්ථ වත්කම් ගත් විට සමස්ථ රක්ෂණ කර්මාන්තය ඉන් 3% ක දායකත්වයක් පමණක් ලබා දෙයි.

පසුගිය වසර තුන තුළ කර්මාන්තයේ ව්‍යුහය සැළකිය යුතු පරිවර්තනයකට ලක්වීම දක්නට ලැබුණ අතර එයට ප්‍රධානම හේතුව වූයේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (IBSL) විසින් ක්‍රියාත්මක කළ නියාමන වෙනස්කම් වූ අතර ඒවා යහපාලනය වැඩිදියුණු කිරීම සහ ප්‍රාග්ධනය කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු වී තිබුණි. මෙම අවශ්‍යතා ඉටුකරලීම සඳහා රක්ෂණ කර්මාන්තය මෑත භාගයේදී අභියෝගාත්මක කාලයක් අත්විදි අතර එහි තුළ වැඩිදියුණුකළ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාම සහ සංයුක්ත සමාගම් වෙන්කිරීම, සමාගම් ලැයිස්තුගත කිරීම සහ අවදානම් පාදක ප්‍රාග්ධන පාලන තන්ත්‍රයකට මාරු වීම වැනි අභියෝග ඇතුලත් වේ.

2014 වසරේ සිට කර්මාන්තයෙහි ප්‍රධාන අත්පත්කරගැනීම් හතරක් සිදුවී ඇති අතර 2016 වසරේ තවත් සමාගම් ඒකාබද්ධවීම් සහ විකිණීම සඳහා අවධානයෙන් පසුවිය. මෙම තත්ත්වය තුලින් තවදුරටත් වෙළෙඳපොල ඒකාබද්ධවීමේ බලාපොරොත්තුවක් පැවති අතර සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයට මෙහි වැඩි බලපෑමක් එල්ලවනු ඇති බවද අපේක්ෂා කෙරුනි. මෙම අපේක්ෂා සනාථ කරමින් සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකක් අත්පත් කරගැනීම් වලට ලක් වූ අතර ඒ අනුව 2016 අවසන් වන විට ජීවිත රක්ෂණ සමාගම් 12 ක් . සාමාන්‍ය රක්ෂණ සමාගම් 12 ක් සහ සංයුක්ත රක්ෂණ සමාගම් 3ක් තිබුණි.

රක්ෂණ සැලසුම් සම්බන්ධයෙන් දැනුවත්භාවය වැඩි කිරීම සඳහා ගත් විවිධ උත්සාහයන් මධ්‍යයේ පවා 2016 මුල් භාගය තුළ පැවති අඩු පොලී අනුපාතික සහ වයස්ගත ජනගහනය වේගයෙන් වැඩිවීම තුළ රක්ෂණ කර්මාන්තයේ රක්ෂණ ආවරණය ලබාගැනීමේ අනුපාතය අඛණ්ඩව අඩු මට්ටමක පැවති අතර ඒ බව සමස්ථ ජනගහනයෙන් ජීවිත රක්ෂණ ලබාගත් සංඛ්‍යාව 12% ක ප්‍රතිශතයකට සීමා වීම මගින් පිළිබිඹු වේ.

මෙම වසර තුළ ද රක්ෂණ කර්මාන්තය මුහුණ පාන අභියෝගවල වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මෙම වසර පුරාම මාගේ නිරීක්ෂණයට ලක්වූ කාරණය වූයේ දැඩි තරගකාරිත්වය රක්ෂණ ක්ෂේත්‍රයේ ලක්ෂණයක් වූ බව හා සමහර තරගකරුවන් මිල අඩු කිරීම් වලට යොමුවී සිටි බවයි. වසර තුළ පැවතුණ අහිතකර කාලගුණික තත්ත්වය නිසා ගං වතුර සහ හදිසි අනතුරු සම්බන්ධ හිමිකම් පෑම් ප්‍රමාණය අසාමාන්‍ය ලෙස ඉහළ ගියේය. තවද ඉහළ බදු හේතුවෙන් වාහන ලියාපදිංචි කිරීම අඩුවීම, ණය වටිනාකම් අනුපාතය අඩුවීම හා වසරේ දෙවන භාගය තුළ වැඩිවූ පොලී අනුපාත සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයට තවදුරටත් අභියෝග එල්ල කළේය.

පාලනය සහ රෙගුලාසි- " රක්ෂණ ක්ෂේත්‍රෙය් අඛණ්ඩතාව කරා"

ආයතනික යහපාලනයේ විනිවිදභාවය සම්බන්ධයෙන් HNB ඇෂුවරන්ස් පොදු සමාගම ගෞරවයට පාත්‍ර වූ සමාගමකි. මෙම පිළිගැනීම සනාථ කිරීම සඳහා HNB ඇෂුවරන්ස් පොදු සමාගම සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම නියාමන සහ ස්වේච්ඡාවෙන් අනුගමනය කරන යහපාලන ක්‍රියාමාර්ග ස්ථාපිත කර තිබේ. සමූහයේ යහපාලන පැතිකඩ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් අප සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 53 සිට 110 දක්වා පිටුවල සටහන් කර ඇත.

රක්ෂණ කර්මාන්තය තුළ රෙගුලාසි සක්‍රිය වෙනස්කම්වලට බඳුන් විය. පසුගිය වසරේ මාගේ පණිවිඩයෙහි දක්වා ඇති පරිදි 2011 අංක තුන දරන රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ සංශෝධන පනතෙහි සඳහන්වන ආකාරයට සියළුම සංයුක්ත රක්ෂණ සමාගම් 2015 ජනවාරි 01 දිනට පෙර තම ව්‍යාපාර වියුක්ත කිරීම සිදුකළ යුතුය. HNB ඇෂුවරන්ස් පොදු සමාගම ඇතුළු බොහෝ රක්ෂණ සමාගම් මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කර තිබේ. කෙසේ වෙතත් වෙළෙඳපොළේ ප්‍රධාන භූමිකාවක් ඇති සමාගමක්ද ඇතුළුව සමාගම් තුනක් ස්ථාවර සහ යහපත් කර්මාන්තයක් සංවර්ධනය කිරීම යන නියාමන අරමුණු වලට අභියෝග කරමින් තවමත් මෙම නියමයන්ට අනුගතව කටයුතු කර නැත. එම නිසා 2016 වසර තුළත් සියළුම අනෙකුත් සමාගම් ඔබගේ සමාගම ද ඇතුළුව තම ව්‍යාපාර කටයුතු සිදුකළේ සාධාරණ නොවන තරඟබිමක සිටය. ඔබගේ සමාගම 2016 වර්ෂය තුළ සියළුම නියාමන අවශ්‍යතා වලට අනුව කටයුතු කරඇති බව ඔබට දන්වන්නේ ඉතාමත් සතුටිනි. සමූහය අවධානම මත පදනම්වූ ප්‍රාග්ධන ක්‍රියාරාමුවට අනුව සිය නියාමන වාර්තාකරණයන් වර්ෂයේ මුල සිටම සිදු කළ අතර නියාමන වශයෙන් දක්වා ඇති අවමයට වඩා ඉහළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත (Capital Adequacy Ratios ) වසර පුරාවටම පවත්වාගෙන ගොස් ඇත.

සමූහයේ කාර්යය සාධනය - ''තිරසාර, ලාභදායි හා සුරක්ෂිතය"

මෙම පසුබිම තුළ අප සමාගම රුපියල් මිලියන 647 ක් බදු පසු ලාභයක් ලෙස වාර්තාකර ඇති බවත් එහි වර්ධන වේගය පසුගිය වසරට සාපේක්ෂව 228% ක් බවත් ඔබට දැනුම් දීමට ලැබීම මා හට සතුටක් ගෙන දෙන්නකි. මෙම සමාගම ආරම්භ කර දා පටන් අද දක්වා අප සමාගම ලද ඉහළම බදු පසු ලාභය මෙය වන අතර එය ලබා ගන්නා ලද්දේ ජීවිත රක්ෂණ අංශයේ වර්ධනය කරන ලද කාර්යය සාධනය සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත පරිපාලිත සමාගමේ යලි පිබිදෙන කාර්යය සාධනයේ සහාය ද සහිතවයි.

ජීවිත රක්ෂණ අංශය රුපියල් බිලියන 3.6 ක දළ ලේඛනගත වාරිකයක් එනම් පසුගිය වසර සමඟ සැසඳීමේදී 27% ක වර්ධනයක් වාර්තා කළ අතර පරිත්‍යාග රක්ෂණ ව්‍යාපාරය (Endowment Business) එහි මූලිකත්වය ගෙන ඇති අතර ජීවිත රක්ෂණයේ සමස්ථ දළ ලේඛනගත වාරිකයෙන් 86% කට දායකත්වය සපයයි. මෙය සනිටුහන් කළයුතු වේගයක් වන අතර පසුගිය වසරේ 19% ක වර්ධන වේගය සමඟ සැසඳීමේදීද අපගේ ආසන්නම තරඟකරු විසින් ලබාගත් වර්ධන වේගයට වඩා එය දළ වශයෙන් 11% කින් වැඩිය. අවම දළ ලේඛනගත වාරිකයක් හඳුන්වාදීම, ලාභදායී නිෂ්පාදිත අලෙවිය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීම සහ වාරිකවල අඛණ්ඩතාව පවත්වාගෙනයාම වැනි කාරණා මෙම කාර්යය සාධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබේ. මිලියන් ඩොලර් රවුන්ඩ් ටේබල් (Million Dollar Round Table) ජයග්‍රහකයන් ගණන පසුගිය වසරේ වාර්තාකල 14 දෙනාගේ සිට 41 ක් දෙනෙක් දක්වා වැඩි කිරීමට හැකිවූ අතර එය පසුගිය වසර 15 තුළ වාර්තාවුන ඉහළම ජයග්‍රහකයන් ගණන වේ.

පසුගිය වසරේ පරිපාලිත සමාගම රුපියල් මිලියන 227 ක අලාභයක් වාර්තාකළ අවස්ථාවේ මම කොටස්හිමිකරුවන්ට පවසා සිටියේ, ඉදිරියේදී, ව්‍යාපාරයේ ලාභදායිත්වය වැඩිකරගැනීම HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම හි මූලික අරමුණු වන බවයි. එවන් යම් යම් ක්‍රමෝපායන් කිහිපයක් මම පසුගිය 2015 වාර්ෂික වාර්තාවේ මතුකොට දැක්වුවෙමි. මෙම අරමුණු අනුව යමින් පසුගිය වසරතුල ඇතිවූ අලාභයට මූලික හේතුව වූ රක්ෂණ හිමිකම් අනුපාතය (Claim Ratio) 88%

සිට 2016 වසරේදී 69% දක්වා සාර්ථකව අඩුකරගැනීමට, HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම සමත් විය. මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා හේතුවූයේ ව්‍යාපාර මිශ්‍රයට කරන ලද ක්‍රමෝපායික වෙනස්කම්ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ඒකාබද්ධ අනුපාතවය (Combined Ratio) අහිතකර කාලගුණික තත්ත්වයන් මත වූ රක්ෂණ හිමිකම් පෑම් වැඩිවීම හමුවේ වුවද 2015 දී පැවති 123% සිට 107% දක්වා අඩු විය. සමාගමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අඛණ්ඩ උත්සාහයන් ගන්නා බව පසුගිය වාර්ෂික වාර්තාවේහිදීද මා විසින් සඳහන් කෙරුණු අතර ඒ අනුව ක්‍රමෝපායික සැළසුම් ක්‍රියාත්මක කිරීම් සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ නව උපකමිටුවක් වර්ෂය ආරම්භයේ පත් කරන ලදී. මෙම කමිටුව තම අරමුණු වෙනුවෙන් මාසිකව රැස්වන අතර සමාගමේ කටයුතු සම්බන්ධයෙන් පුරෝගාමී භූමිකාවක් නිරූපණය කරනු ලබයි.

මෙම සියළු ක්‍රියාමාර්ග අපගේ කණ්ඩායමේ කැපවීම සහ අභිප්‍රේරණය මත HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමට තම ගමන යළි යහපත් අතට හරවමින් රුපියල් මිලියන දෙකක ලාභයක් පළමු කාර්තුව ඇතුළතදීම වාර්තා කිරීමට හැකිවිය. කෙසේ වෙතත් මෙම ප්‍රගතිය, දෙවන හා තෙවන කාර්තුවල ඇතිවූ ගංවතුර තත්ත්වය හා ගින්න හේතුවෙන් වාර්තාවූ රු.මිලියන 880 ක රක්ෂණ හිමිකම් හේතුවෙන් පසු බෑමකට ලක්විය. නමුත් අවසන් කාර්තුවේ වූ විශිෂ්ට කාර්යය සාධනය නිසා සමාගමට දළ ලේඛනගත වාරිකය ලෙස රුපියල් බිලියන 3.1ක් වාර්තා කිරීමට හැකි වූ අතර එය 16% ක වර්ධනයකි. මෙම කාර්යය සාධනය කර්මාන්තයේ සමාන්‍ය වර්ධන වේගය 2% ක ප්‍රමාණයකින් ඉක්මවීමක් වන අතර බදුවලින් පසු ලාභය රුපියල් මිලියන 47 ක් බවට පත් කිරීමටද හේතු විය.

වෙළෙඳපොළ අපේක්ෂාවන් අභිබවා යන මෙම සතුටුදායක ජයග්‍රහණ අපගේ කොටස්කරුවන්ට මූල්‍යම ප්‍රතිලාභ ලබා දීම පමණක් නොව වඩා ශක්තිමත් සහ ස්ථාවර සමාගමක් සඳහා අඩිතාලම දැමීමට ද සමත් වී තිබේ. මෙම වසර තුළ ජීවිත අරමුදල (Life Fund) රුපියල් බිලියන 1.7 කින් වැඩි වී ඇති අතර එය 25% ක වර්ධනයකි. කළමනාකාරිත්වය යටතේ ඇති අරමුදල් (Funds Under Managment) රුපියල් බිලියන 9.9 ක් දක්වා 25% කින් වැඩි වී තිබේ. එසේම අප සමාගම ශ්‍රී ලංකාවේ ඉහළම සන්නාම නාම 100 ලැයිස්තුගත ව සිටින අතර HNB ඇෂුවරන්ස් පොදු සමාගම සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම් දෙකම ෆිච් රේටිං ලංකා ලිමිටඩ් (Fitch Rating Lanka) මගින් ස්ථාවර දර්ශනයක් සහිතව ‘A’ lka රක්ෂණ මූල්‍ය ශක්ති ශ්‍රේණිගත කිරීමත් ලබා ඇත.

තව දුරටත් මෙම ආයතන දෙකම එහි ප්‍රතිරක්ෂණ මණ්ඩලය ප්‍රවේශමෙන් තෝරාගෙන ඇති අතර ඒවා ‘A’ශ්‍රේණිය සහිත වීම නිසා අප සමාගමට විශ්වාසයක් සහ ශක්තියක් ලබාදෙයි. මෙම ජයග්‍රහණ සමඟ ඔබ සමාගම ඓන්ද්‍රීය (Organic)සහ අනෛද්‍රී(Inorganic) වශයෙන් තවදුරටත් වර්ධනයට සූදානම්ය.

<u>ලාභාංශ - කොටසක ඉපයුම රු.12.95</u>

2016 වර්ෂය සඳහා වාර්තාවූ සමාගමේ කාර්යය සාධනය පදනම් කරගෙන එක කොටසකට රු.5.00 බැගින් වූ අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් යෝජනා කරන අතර පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී එය 150% ක වර්ධනයකි. 2016 සඳහා සමාගමේ කොටසක ඉපයුම රු.12.95 ක් ලෙස වාර්තා වී තිබේ.

සමාජ සහ සබඳතා ප්‍රාග්ධනයේ ආයෝජන - ''කැපවුනු''

තම සමාජ වගකීම් මූලාරම්භයන් අඛණ්ඩව පවත්වාගෙන යමින් සමාගම තම සම්මානයට පාත්‍රවූ ආයතනික සමාජ වගකීමේ කාර්යයක්වන ජල කළමනාකාරිත්ව වැඩසටහන්වල ආයෝජනය කිරීම අටවන වරටත් සිදුකළේය. රටෙහි ග්‍රාමීය ප්‍රදේශවල පානීය ජල පහසුකම් නැති පාසල් බොහොමයක් හඳුනාගැනීමට අපට හැකි විය. ඒ අනුව අම්පාර, මඩකලපුව, තෙල්දෙණිය සහ ගල්ගමුව කළාප වල පාසල් හතක් මෙම වසර තුළ ආයතනික සමාජ වගකීම යටතේ සිදුකළ ජල කළමනාකාරිත්ව වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලද අතර මේ සමග ආරම්භයේ සිට අප විසින් දියත් කළ පානීය ජලය ලබා දීමේ වැඩසටහන් ගණන 43 දක්වා වැඩි විය. ඊට අමතරව 'Blood Drive' නමින් ලේ දන් දීමේ වැඩසටහනක් අප සමාගම විසින් සාඩම්බරව සංවිධානය කරන ලද අතර එය අඛණ්ඩව එකොලොස්වන වරට සිදු කරන ලදී. සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කරමින් සමාගම විසින් සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීම සම්බන්ධයෙන් වැඩසටහන් රාශියක් සඳහා අනුග්‍රහය දක්වන ලදී. තවදුරටත් රටේ කළා හා සංස්කෘතික කටයුතු ඉහළ නැංවීම අරමුණු කරගෙන HNB ඇෂුවරන්ස් සමාගම දක්ෂ කළාකරුවන් සඳහා ඇගයීම් සිදු කරන ලදී. අපි ක්‍රියාත්මක වන සමාජයට සහ එහි ජනතාවට නැවත ප්‍රතිලාභ ලබා දිය යුතුය යන දැඩි විශ්වාසය මත අප සමාගම විසින් අපගේ දේශය පුරා සිනහා නංවන්නට හැකි සෑම අවස්ථාවකම උත්සාහ දරන බව මම නැවතත් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ගෞරව සම්මාන 'ඇගයීමකි'

අප සමාගමේ විශිෂ්ට වර්ධනය සනිටුහන් කරමින් HNB ඇෂුවරන්ස් පොදු සමාගම සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම මෙම වසරේදී ද ගෞරවනීය සම්මාන රාශියකට බඳුන්විය. සමාගමේ 2015 සඳහා වූ සංකලිත වාර්ෂික වාර්තාව SAFA සම්මාන උළෙලේදී රක්ෂණ කාණ්ඩයේ ජයග්‍රාහකයා ලෙස තෝරාගන්නා ලදී. ඒ අතරම සමාගමට තම සංකලිත වාර්ෂික වාර්තාව සඳහා CMA සංකලිත වාර්ෂික වාර්තා සම්මාන උළෙලේ දී හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද 52 වන වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී තවත් ඉහළ සම්මාන දිනා ගැනීමට හැකි විය. එසේම Fintelekt සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (Insurance Association of Sri Lanka) විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්ත සම්මාන උළෙලේදී ද සම්මාන දෙකක් අප සමාගමට ලබා ගත හැකි විය. ක්ෂුද්‍ර රක්ෂණය සඳහා සමාගමේ දායකත්වය සහ ජල කළමනාකරන වැඩසටහන යටතේ සිදුකළ ආයතනික සමාජ වගකීම වෙනුවෙන් මෙම සම්මාන ලබා දෙන ලදී.

ඉදිරි දැක්ම - ' ශුභවාදීයි'

වසර 15 ක් පමණක් සම්පූර්ණ කළ සාපේක්ෂ වශයෙන් තරුණ තරඟකරුවෙකු වන HNB ඇෂුවරන්ස් පොදු සමාගම මෙම වසර කිහිපය පුරාම තිරසාර වර්ධනයක් ළඟාකරගෙන තිබේ. තරඟකරුවන් 15 ක් සිටින වෙළෙඳපොළ තුළ ජීවිත රක්ෂණ සමාගම් අතර 06 වන ස්ථානයේ රැඳී සිටීමට සමාගමට හැකියාව ලැබී ඇති අතර පිරිවැටුමේ හා ලාභදායිත්වයේ වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් තම මව් සමාගම වන හැටන් නැෂනල් බැංකු පොදු සමාගමේ ශක්තිය පන්නරයක් කරගනිමින් තම කොටස් හිමිකරුවන්ට වැඩි වටිනාකමක් ඇති කිරිමට උත්සාහ දරනු ඇත. අප සමාගම තම නිෂ්පාදන කළඹ වැඩි දියුණුවක් සහ ලාභදායී විභවයන් වෙත යොමු කිරීමෙන් සහ වැඩි ආරක්ෂාවක් ලබා දීම පිළිබිඹු වන ආකාරයට තම නිෂ්පාදන නැවත ස්ථානගත කරමින් ඉහත කාරණා සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරයි. එසේම සමාගම තම පාරිභෝගිකයන්ට ළඟා විය හැකි විශාලම මාධ්‍ය වන නියෝජිතයන් යොදාගනිමින් සහ හැටන් නැෂනල් බැංකු සමූහය තුළ තිබෙන සහක්‍රියාවන් හි ප්‍රයෝජනය ගෙන කටයුතු කිරීමටත් අපේක්ෂා කරයි.

අතිශය තරඟකාරී සහ දුෂ්කර වෙළෙඳපොළක ප්‍රශංසනීය පරිවර්තනයක් ළඟාකරගත් HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම තම ආදායමෙහි වර්ධනය ක්‍රමයෙන් වැඩි කරමින් ව්‍යාපාරයේ

ලාභාදායිත්ව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් කිහිපයක් දැනටමත් සිදුකර ඇති අතර තාක්ෂණය වැඩි වශයෙන් භාවිතා කරමින් පාරිභෝගිකයන්ට වඩා හොද අත්දැකීම් වැඩිදියුණු කරමින් සමාගමේ ව්‍යාපාර සංවර්ධන අංශ ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර ඇත. සමාගම වර්තමානයේදී අනෛද්‍රීය වර්ධනය (inorganic growth) සඳහා ඇති හැකියාවන් සම්බන්ධයෙන් සොයාබලමින් සිටින අතර එය දීර්ඝ කාළීනව ක්‍රමෝපායික වශයෙන් වාසිදායක වනු ඇත.

කෘතඥතාව - 'ස්තූතිය'

මෙම වසර තුළ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරි නිරන්ජන් මානික්කම් මහතා, ප්‍රධාන මූල්‍ය නිලධාරි විපුල ධර්මපාල මහතා , ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි නාමල් ගුණවර්ධන මහතා, මානව සම්පත් අංශ ප්‍රධානී ශාලිකා හේවාවිත්‍රම මෙනවිය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ශිරෝමි හල්ලොලුව මෙනවිය යන කළමනාකරණ ප්‍රධානීන් තම තනතුරු වලින් ඉවත් වූහ. ඔවුන් සියළු දෙනා මෙම සමාගමේ උන්නතිය වෙනුවෙන් දැක්වූ අනගි දායකත්වය වෙනුවෙන් ඔවුන් සියළු දෙනාටම මගේ අවංක ඇගයීම මෙහි වාර්තා කිරීමට කැමැත්තෙමි.

එසේම මුළු HNB ඇෂුවරන්ස් කාර්ය මණ්ඩලයටම ස්තුති කිරීමටත් විශේෂයෙන්ම Bancassurance අංශය මූලාරම්භයන් සම්බන්ධයෙන් කටයුතු කරන පිරිසට මෙම මාර්ගය ඔස්සේ අපූර්ව වර්ධනයක් ලබා ගැනීමට ඔවුන් ලබා දුන් සහාය සම්බන්ධයෙන් ස්තුති කිරීමටත් මම බලාපොරොත්තු වෙමි.

පත්කිරීම් - ' පිළිගැනීම්'

රක්ෂණ කර්මාන්තය තුළ වසර ගණනාවක අත්දැකීම් ඇති මරීනා තාමරත්නම් මැතිනිය HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමෙහි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක් ලෙස **2016** සැප්තැම්බර් **01** දින සිට පත් කරන ලදී.

වසර **23** ක සේවා කාළය තුළ රක්ෂණ කර්මාන්තය තුළ ජ්‍යෙෂ්ඨ තනතුරු රාශියක් දැරූ දීප්ති ලොකුආරච්චි මහතා **2016** මැයි **02** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි HNB ඇෂුවරන්ස් පොදු සමාගම සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම හි ප්‍රධාන විධායක නිලධාරි තනතුරට පත් කරන ලදී. මෙම පත්වීමට පෙර එතුමා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කර ඇත.

මම ඒ දෙදෙනාවම අපගේ සමාගමට උණුසුම්ව පිළිගනිමි. එසේම කර්මාන්තය තුළ ඔවුන්ගේ පළපුරුද්ද සහ නිපුණත්වය අප සමාගමට ඉහළට ගමන් කිරීමට ඇති ශක්තියක් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

HNB ඇෂුවරන්ස් සමාගම හි නීති අංශයේ ප්‍රධානි සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වන සීතාරි ජයසුන්දර මහත්මිය HNB ඇෂුවරන්ස් සමාගම හි අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් ලෙස පත් කර තිබේ. HNB ඇෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම එතුමියව උණුසුම් ලෙස පිළිගනිමි.

ඇගයීම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමිය, අධ්‍යක්ෂ ජෙනරාල්තුමිය සහ අනෙකුත් නිළධාරීන්ට **2016** වසර පුරා ඔවුන් ලබා දුන් අඛන්ඩ සහයෝගය වෙනුවෙන් අපගේ ස්තුතිය පළ කිරීමට මම මෙය අවස්ථාවක් කොට ගනිමි. එසේම රක්ෂණ කර්මාන්තය යහපත වෙනුවෙන් ලබාදෙන දායකත්වය වෙනුවෙන් රක්ෂණ ඔම්බුඩ්ස්මන් වරයාටද මගේ ස්තුතිය පිරිනමමි.

සියළුම සහෝදර අධ්‍යක්ෂවරුන්ට ඔවුන් මාහට ලබා දුන් ශක්තිමත් සහාය, සහයෝගය සහ මඟපෙන්වීම සිහිපත් කරමින් එය අගය කරමි. ඔවුන්ගේ නොමසුරු සහාය නොමැතිව මෙම අභියෝගාත්මක කාලය තුළ මෙම සමාගම ඉදිරියට ගෙන යාමට මට හැකියාවක් නොලැබෙනු ඇත. එසේම නව ප්‍රධාන විධායක නිලධාරිතුමාට, කළමනාකාරිත්ව කණ්ඩායම සහ කාර්ය මණ්ඩලයටත් වසර පුරා අනගි ප්‍රතිඵල ලබා දීම සඳහා කල දැඩි හා අඛන්ඩ කැපවීම සම්බන්ධයෙන් මගේ අවංක ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

අවසන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සියළුම පාර්ශ්වකරුවන්ට ඔවුන් අප වෙත තැබූ විශ්වාසය වෙනුවෙන් මම ස්තුතිවන්ත වන අතර අචාරධර්මීයව සහ ආයතනික යහපාලන ප්‍රමිති ඉහළ මට්ටමක පවත්වාගනිමින් අපගේ පාර්ශ්වකරුවන්ට වැඩි තිරසාර වටිනාකමක් ලබා දීමට අප අඛණ්ඩව කටයුතු කරන බව තහවුරු කරමි.

රෝස් කුරේ

සභාපතිනි

**2017** පෙබරවාරි 09

**පහත දැක්වෙනුයේ HNB Assurance පොදු සමාගමේ 2016 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 36 - 39 හි සඳහන් ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.**

## ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විවරණය

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ සංකලිත වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මෙසේ ඔබ වෙත ඉදිරිපත් කරන්නේ හදපිරි සතුටිනි. අප සමාගමේ සහ එහි පූර්ණ හිමිකාරත්වයට නතු පරිපාලිත සමාගම වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ තෙවැදෑරුම් අවසන් කාර්යයසාධනය ආවරණය වන පරිදි සකසා ඉදිරිපත් කෙරෙන අපගේ පස්වන සංකලිත වාර්ෂික වාර්තාව මෙයයි.

තවද, 2016 වර්ෂය යනු ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ විසඳුම් ලබාදෙමින් සාර්ථකව අපගේ මෙහෙයුම් කටයුතුවල නිරත වූ 15 වන වර්ෂය බව මෙහි සටහන් කරන්නේ ඉමහත් සතුටිනි. මෙම වාර්තාවේ ප්‍රධාන තේමාව හරහා පිළිබිඹු වන අන්දමට, පෙර සේම අපි ඉදිරි අනාගතයේදී ද අපගේ පාර්ශවකරුවන් තුටුපහටු කිරීමට අඛණ්ඩව වෑයම් දරන්නෙමු.

පෙර වර්ෂය හා සසඳන කල්හි සිත්ගන්නාසුලු 228%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රු. මිලියන 647ක බදු පසු ලාභයක් ලැබීමට HNB ඇෂුවරන්ස් පොදු සමාගම (HNBA) සහ එහි පූර්ණ හිමිකාරත්වය ඇති පරිපාලිතය වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම (HNBGI) සමත්වී ඇති බව වාර්තා කරන්නේ අභිමානයෙන් යුතුව ය. තවද, රු. බිලියන 6 සීමාව පසුකරමින් ඒකාබද්ධ දළ ලේඛනගත වාරිකය වශයෙන් රු. බිලියන 6.7ක් වාර්තා කිරීමට අප සමූහයට හැකි විය. අපගේ ආදායමේ ක්‍රමික වර්ධනය තුළින් පිළිබිඹු වන්නේ අප සමූහය රක්ෂණ කර්මාන්තය තුළ වඩාත් වේගයෙන් වර්ධනය වන්නාවූ සමූහයක් වන බව යි.

## අභියෝගාත්මක වාතාවරණය

සාර්ව ආර්ථික අංශයෙන් මෙන්ම, සංඛ්‍යාවෙන් හා මූල්‍යමය වටිනාකමින් ද අසාමාන්‍ය ලෙස ඉහළ අගයක් ගත් වන්දි අයදුම් ප්‍රමාණයක් අප වෙත ඉදිරිපත්වන්නට හේතු සලසමින් මැයි මාසයේදී අත්විඳින්නට වූ බරපතළ ජලගැලීම් තත්ත්වය හේතුවෙන් මෙහි සලකා බැලෙන වර්ෂය රක්ෂණ අංශයට සැබැවින්ම අභියෝගාත්මක වර්ෂයක් විය. මේ හේතුවෙන් සාමාන්‍ය රක්ෂණයේ ලාභ ආන්තිකය අඩුවූ අතර එය ආයෝජන අවස්ථා සීමා කිරීමටද හේතු විය. ජීවිත රක්ෂණ අංශය ගත්කළ ඉහළ ගිය පොළී අනුපාත හේතුවෙන් ආදායමින් සෑහෙන කොටසක් ඉතුරුම් හා ආයෝජන වෙත යොමු වී තිබේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (IBSL) විසින් ක්‍රියාත්මක කරනු ලැබූ නව මාර්ගෝපදේශ යටතේ නුබුන්වත්කම් ක්‍රමය මත පදනම් වූ පාලන තන්ත්‍රය (Solvency Regime) සිට අවදානම පදනම් කරගත් ප්‍රාග්ධන පාලන තන්ත්‍රයට (Risk Based Capital-RBC) ප්‍රවේශ වූ ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට 2016 වර්ෂය යනු ඉතා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන වර්ෂයකි. RBC පාලන තන්ත්‍රය අනුව, රක්ෂණ සමාගම් විසින් භාරගන්නා අවදානමට සරිලන අවම ප්‍රාග්ධන ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතු ය. මේ සමගින් ඉදිරියට යන රක්ෂණ කර්මාන්තය මෙම නව පාලන ක්‍රමයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි රක්ෂණ නිපැයුම් සම්බන්ධයෙන් මෙන්ම අරමුදල් ආයෝජනය සම්බන්ධයෙන් ද වඩාත් ප්‍රත්‍යස්ථ ප්‍රවේශයක් ගැනීමට කටයුතු කරනු ඇත. වඩාත් ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවත්වාගෙන යාමට එම නව නියමයන් හරහා සමාගම් යොමු කරවනු ඇති අතර, සමාලෝචිත වර්ෂය තුළ සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ දක්නට ලැබුණු අත්කර ගැනීම් දෙක හරහා පෙන්නුම්කළ පරිදි කර්මාන්තයේ ක්‍රියාකාරීන් අතර ඒකාබද්ධවීමේ පෙරනිමිති දිස්වේ. සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ පවත්නා දැඩි තරඟකාරීත්වය හේතුවෙන් වෙළඳපොල ක්‍රියාකාරීන් දිගින් දිගටම ඒකාබද්ධ කිරීම් සහ අත්කරගැනීම් සොයායාමට පෙළඹෙනු ඇති අතර ඉදිරි වර්ෂයේදී ද මෙම නැඹුරුව එලෙසම පවතිනු ඇතැයි අපි විශ්වාස කරමු.

කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණය

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

පවත්නා අභියෝගාත්මක වටපිටාව මධ්‍යයේ, 2016 වර්ෂය සමූහයේ ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා සැලකිය යුතු අයුරින් විජයග්‍රාහී වර්ෂයක් ලෙස සනාථ වී ඇත. රක්ෂණ කර්මාන්තයේ 19% ක වර්ධනය ඉක්මවා යමින් 27% ක වර්ධනයක් සනිටුහන් කරමින් දළ ලේඛනගත වාරිකය රු. බිලියන 3.6 ලෙස දක්වා වාර්තා කිරීමට අපට හැකි විය. මෙම ජයග්‍රහණයන් සමගින්, HNB ඇෂුවරන්ස් පොදු සමාගම වෙළඳපොල තුළ 6 වන ස්ථානය පවත්වා ගෙන යයි. 2015 වර්ෂයේ අත්පත් කර ගන්නා ලද 19% ක වර්ධනයට සාපේක්ෂව අපගේ මෙම වර්ෂයේ වර්ධනය සැලකිය යුතු අයුරින් වේගවත් කර ගැනීමට අපට හැකි වූ බව ද සටහන් කිරීම උචිත යැයි සලකමි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව 32% කින් වර්ධනය වූ පරිත්‍යාග රක්ෂණ ඔප්පු (Endowment Policy) මගින් සමස්ථ දළ ලේඛනගත වාරිකයෙන් 86% කට දායක විය. මෙහිලා කැපීපෙනෙන දායකත්වයක් දැක්වූ යේ මයි ෆන්ඩ් (My Fund) සහ රන්මග (Ranmaga) රක්ෂණ සැලසුම්ය. මෙහි අතර උකස් සුරැකුම් රක්ෂණ ඔප්පු (Mortgage Reducing Policy) 15% ක වර්ධනයක් වාර්තා කොට ඇත. මෙම රක්ෂණ නිපැයුම් මිශ්‍රයෙහි ඇතිකළ වෙනස, සමාගම සිය ක්‍රමික වාරික රක්ෂණ කළඹ ශක්තිමත් කිරීමට ගනු ලැබූ ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි. පළමු වසරේ රක්ෂණ ඔප්පු අකර්මන්‍යවීමේ අනුපාතය (Lapse Ratio) 46% ක පවත්වාගෙන යාමට හැකිවිය. මේ සඳහා බෙදාහැරීම් කළමනාකරණ කණ්ඩායම විසින් පාරිභෝගික ඛණ්ඩනය කිරීම දිරිගැන්වීම හා රක්ෂණ ඔප්පු පරිපාලනය සහ පවත්වාගෙන යාම සඳහා අනුගමනය කරන ලද නව ප්‍රවේශයන් ද උපකාරී වී ඇත. පෙර වසරේ දී ලද රු. මිලියන 427 ක ලාභය අභිබවා 40% ක වර්ධනයක් පෙන්නුම් කරමින් HNB ඇෂුවරන්ස් සමාගම රු. මිලියන 600 ක මෙතෙක් ලද ඉහළම ලාභය වාර්තා කොට ඇත. ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් කොටස්හිමියන්ගේ අරමුදලට මාරු කෙරෙන අතිරික්ත ලාභයද 49% ක වර්ධනයක් සනිටුහන් කරමින් 2015 වර්ෂයේ දී ලද රු. මිලියන 310 ක අගයට සාපේක්ෂව රු. මිලියන 461 ක අගයකට ළගා විය .

වර්ෂය අවසානවීමත් සමඟ ජීවත රක්ෂණ අරමුදල (Life Fund) රු. බිලියන 8.6 කට ළඟා වුණු අතර සමාගම රක්ෂණ ඔප්පු හිමියන් සඳහා රක්ෂණය කරන ලද රු.1,000 කට රු. 54 ක උපරිම ප්‍රසාද දීමනාවක් ද අරමුදල මත පදනම් වු ප්‍රතිලාභ රක්ෂණ ඔප්පු (Fund based) හිමිකරුවන් සඳහා 8% ක ලාභාංශ අනුපාතයක් ද ප්‍රකාශයට පත් කරන ලදී.

අපගේ සිත්ගන්නාසුලු පිරිවැටුම මගින් පිළිබිඹුවනුයේ රක්ෂණ නියෝජිතයන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලවන අතර ඉහළ මට්ටමක වෘත්තියමය ස්වභාවයක් පවත්වාගැනීම සඳහා අප දක්වන උනන්දුවේ ප්‍රතිඵලය වී ඇත්තේ මිලියන් ඩොලර් රවුන්ඩ් ටේබල් (Million Dollar Round Table) සඳහා සහභාගි වීමේ සුදුසුකම් ලද රක්ෂණ නියෝජිතයන් 41 ක් නිර්මාණය කිරීමට හැකිවීමයි. ඒ අතරින් සාමාජිකත්වයේ ඉහළින්ම සිටින එක් සාමාජිකයෙකුත් (Top of the table), කෝර්ට් ඔෆ් ද ටේබල් සාමාජිකත්වයේ එක් සාමාජිකයෙකුත් (Court of the table) සිටීමේ ආඩම්බරය විඳගැනීමට සමාගමට හැකි වී ඇත. මෙය ඉතාම සිත් ඇදගන්නාසුලු ප්‍රතිඵලයක් වන්නේ කලින් වර්ෂයේ දී සුදුසුකම් ලබන ලද්දේ රක්ෂණ නියෝජිත බලකායෙන් සාමාජිකයන් 14 දෙනෙකු පමණක් වීම නිසාවෙනි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

අප රක්ෂණ සමූහයේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිරිවැටුම සහ ලාභදායිත්වය යන දෙකෙහිම මනා වර්ධනයක් වාර්තා කොට ඇත. 2015 වර්ෂය තුළ දි අභියෝගයන්වූ බොහොමයක් හානිකර තත්ත්වයන් 2016 වර්ෂයේ දි සාර්ථකව හසුරුවන ලදී. සාමාන්‍ය රක්ෂණය, එහි ස්වභාවයෙන්ම අනපේක්ෂිත තත්ත්වයන්ට ඉතාම නැඹුරු බැවින් එවන් අභියෝගයන්ට නිසි අයුරින් මුහුණ දීම සඳහා සුදානම් සහිත තත්ත්වයක පසුවීමට අවශ්‍ය වන තීරණයන් ගැනීම, කාලෝචිතව සිදුකිරීමට කළමනාකාරිත්වය සතු හැකියාව, සාර්ථකත්වය සඳහා ඉතාම වැදගත් අවශ්‍යතාවයකි. අවදානම් තෝරාගැනීම, මිලකරණය හා වියදම් කළමනාකරණය කෙරෙහි දැඩි අවධානයක් යොමුකෙරුණු අතර, ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය තුළින් 2016 වර්ෂයේ දී එවන් සුදානම් සහගත තත්ත්වයක් සාධනීය අයුරින් පවත්වාගෙන යන ලදී. අප කණ්ඩායම මෙම ප්‍රධාන අංගයන් ත්‍රිත්වය අතිවිශිෂ්ට ලෙස හැසිරවීම හේතුකොටගෙන අනාගතය සඳහා තිරසාර ව්‍යාපාරික ආකෘතියක් (Business

model) ඇති කිරීමට දායකවීම ද 2016 වර්ෂයේ ඒකාබද්ධ පිරවැටුම සහ ලාභයේ වර්ධනය කෙරෙහි වැදගත් දායකත්වයක් ද ලැබුනි . ඒ අනුව 16% ක වර්ධනයක් අත්කරගනිමින් වර්ෂයේ දළ ලේඛනගත වාරිකය රු. බිලියන 3.1 ක් ද ලාභය ලෙස රු. මිලියන 47 ක් ද වාර්තා කළේය.

සාර්ථකත්වයේ මිහිරි සුවඳින් ප්‍රාණවත් වූ, දූරදර්ශී චින්තනයක් සහිත අධ්‍යක්ෂ මණ්ඩලයක මගපෙන්වීමට ලක්වන, උනන්දුවෙන් හා ක්‍රියාශීලිව කටයුතු කරන කළමනාකාරවරුන් කණ්ඩායමකගේ නායකත්වය සහිත කැප වූ සේවා බලකාය, ඉදිරි අනාගතයේ දී HNBGI හි තිරසාර ලාභදායිත්වයක් ඇති කර ගැනීමට කඩිනමින් ප්‍රවේශ වනු ඇති බව මා හට විශ්වාසය.

ආයෝජනය

අභියෝගකාරී සාර්ව ආර්ථික වටපිටාවක් පැවතිය ද වර්ෂය තුළ දී අප විසින් යොදා ගන්නා ලද අරමුදල් කළමනාකරණ ප්‍රයත්නයන් හේතු කොට ගෙන ස්ථාවර ආදායම් සහ කොටස් ආයෝජන යන දෙඅංශයෙන්ම වෙළඳපොල මිනුම් ලකුණු අභිභවා යාමට අපට හැකි ව ඇති බව හෙළිදරවු කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි. අපගේ ආයෝජන කළඹයන් සඳහා රුපියල් බිලියන 1.1 ක ආයෝජන ආදායමක් ලබාගත්තේ 25% ක සැලකිය යුතු වර්ධනයක් ද වාර්තා කොට ගනිමිනි. සමූහයේ සමස්ත ආයෝජන ආදායම කෙරෙහි මව් සමාගමෙන් සිදු කරන ලද දායකත්වය රු. මිලියන 958 ක් වන අතර එය 31% ක වර්ධනයක් පෙන්නුම් කෙරුනි. ආයෝජන අරමුදල්වල 25% ක වර්ධනයත් විචක්ෂණශීලි ආයෝජන ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමත් මේ සඳහා බෙහෙවින් උපකාරී විය.

අපගේ පරිපාලිත ආයතනය වන HNBGI සමාගම, රු. බිලියන 187 ක ආයෝජන ආදායමක් සමගින් දායකත්වය සපයන ලද අතර එය පෙර වර්ෂය හා සන්සන්දනය කිරීමේදී 0.9% ක අඩුවීමකි. මෙහි දී ගංවතුර හා සම්බන්ධයෙන් සිදු කරන ලද හිමිකම් පෑම නිසා ඇතිවූ අරමුදල් පිටතට ගලා යාම් හේතු කොටගෙන අපේක්ෂාකල ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි විය.

පොළී අනුපාතයන් ඇතුළුව, ආර්ථික දර්ශකයන්ගේ වෙනස්කම් සිදුවීම් පුරෝකථනය කිරීමේ නිරවද්‍යතාව සහ ප්‍රමාණවත් පරිදි අවදානම් කළමනාකරණය කරමින් වෙළඳපොල තත්ත්වයන් පිළිබඳ කාල නිර්ණය කිරීම තුළ පැවති ඉහළ ප්‍රවීනත්වය තුළින් පොලී ආදායම 35% කින් ඉහළ නංවා ගැනීමට හැකිවිය. කොටස් වෙළඳපොල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතාවය හේතු කොටගෙන කොටස් ආයෝජන අඩුකළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ධන ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඉඩකඩ අඩු විය. කෙසේ වුව ද, මා එය දකින්නේ ප්‍රතිඵල අත්කරගැනීම සඳහා නිවැරදි දිශාවට තබන ලද ඥානාන්විත පියවරක් වශයෙනි. අප විසින් නිසිකලට ගන්නා ලද අරමුදල් කළමනාකරණ තීරණ හේතු කොට ගෙන අපගේ ආයෝජන වලට 8.1% ක සාමාන්‍යයකින් සියළු කොටස් මිල දර්ශක (ASPI) අභිබවා යාමට හැකිවිය. සමාගමේ අභ්‍යන්තර අරමුදල් කළමනාකරණ කණ්ඩායමේ ප්‍රවීණත්වය, තවදුරටත් ලාභදායිත්වය වර්ධනය කිරීමට දැඩි දායකත්වයක් සැපයූබව මෙහි දී සනිටුහන් කළයුත්තකි.

ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ ස්ථායිතාවය

HNBA සහ HNBGI යන සමාගම් දෙකම කලින් පැවති නුබුනු වත්කම් පදනම් වූ පාලන තන්ත්‍රයේ (Solvency Regime) සිට අවදානම් මත පදනම් වූ පාලන තන්ත්‍රය (Risk Based Capital Regime) දක්වා පහසුවෙන් සංක්‍රමණය විය. මෙම ව්‍යාපාරයන් දෙකම අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ක්‍රියාරාමුව පිළිබඳ පෙරහුරුවට සහ පෙර වසරවල ඒ හා සමාන්තරව සිදු වූ ක්‍රියාත්මක කිරීම්වලට සහභාගිවීම ද, බාහිර ආයුඝනකවරුන්ගේ ප්‍රවීණ උපදෙස් පරිදි අභ්‍යන්තර ශක්‍යතාවය ගොඩනගාගැනීම ද, නව ක්‍රියාරාමුව සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හේතුවිය. 2016 දෙසැම්බර් 31 වන දින වන විට HNBA විසින් 445% ක හා HNBGI විසින් 168% ක ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයක් (Capital Adequacy Ratio-CAR) වාර්තා කරන ලද්දේ ගිවිසුම් සහ වෙනත් වගකීම් සඳහා කළ සියලු වෙන්කිරීම් වලින් අනතුරුවයි.

මුල්‍ය ස්ථායිථාවය පිළිබඳ මනා පිළිබිඹුවක් සනිටුහන් කරමින් තවත් වර්ෂයක් සඳහා අප ආයතන දෙක වෙත ස්ථාවර බලාපොරොත්තුවක් සහිතව ෆිච් රේටින්ස් ලංකා ලිමිටඩ් (Fitch Ratings Lanka Ltd.) ශ්‍රේණිගත කිරීමේ සමාගම විසින් ජාතික දීර්ඝකාලීන ශ්‍රේණිගත කිරීම සහ රක්ෂණකරුවන්ගේ මුල්‍යමය ශක්තිය පිළිබඳ ශ්‍රේණිගත කිරීම සඳහා "A lka" ශ්‍රේණිගත කිරීම් යළි තහවුරුකරන ලදී.

ස්තුතිය

මාවෙත සහ අපගේ සමාගම වෙත, සභාපතිතුමිය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දක්වන ලද පූර්ණ සහයෝගය, මඟපෙන්වීම සහ දිරිගැන්වීම සම්බන්ධයෙන් මාගේ අවංක අගය කිරීම ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙමි.

එසේ ම සලසන ලද සහාය වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරියට, අධ්‍යක්ෂ ජනරාල්වරියට සහ කාර්ය මණ්ඩලයට ද මම ස්තුතිවන්ත වෙමි.

වසර පුරා විශේෂිත ප්‍රතිඵල අත්පත් කරගැනීමෙහිලා ලබා දෙන ලද නොමසුරු සහයෝගය වෙනුවෙන් විධායක කමිටුවේ සාමාජිකයන්, අංශ ප්‍රධානින්, කළමනාකාරවරුන්, කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ විකුණුම් සහ ක්ෂේත්‍ර බලකා සාමාජිකයන් වෙත මාගේ විශේෂ ස්තුතිය පුද කරමි.

ලබා දුන් සහාය වෙනුවෙන් අපගේ සියළුම තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂණකරුවන්, අතරමැදි සමාගම් සහ රක්ෂණ ජාල සහ ක්‍රමෝපායික හවුල්කරුවන් පිළිබඳ සඳහන් කිරීමක් සහ ස්තුති කිරීමක් සිදු නොකළහොත් මාගේ කාර්යභාරය සම්පූර්ණ නොවනු ඇත.

ඉදිරිමග

ඉදිරි වර්ෂවල ද අවදානම් මත පදනම් වූ ක්‍රියාරාමුව තවදුරටත් ස්ථාවර වනතෙක් රක්ෂණ වෙළඳපොල අභියෝගකාරී අයුරින් පවතිනු ඇති බවට මම විශ්වාස කරමි. සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය තුළ යම්කිසි ආකාරයේ ඒකාබද්ධවීම නිරීක්ෂණය කරන නමුදු තරඟකාරීත්වය තවදුරටත් ඉහළ යනු ඇත. නියාමන වෙනස්කම්වල ගතික අවස්ථාව, වෙළඳපොල තුළ ප්‍රධාන භූමිකාවක් දරනු ඇත.

රක්ෂණ කර්මාන්තය සඳහා බොහෝ විට රථ වාහන රක්ෂණ නොවන සහ ජීවිත රක්ෂණ අංශයන් තුළ වඩා වැඩි අවස්ථාවන් උදාවනු ඇති බවට පොදුවේ බලාපොරොත්තු පවතී.

ඉදිරි වර්ෂයන් තුළ දී උපරිම වාසිදායකත්වයක් ලබා දීම සඳහා අප විසින් අඛණ්ඩව අපගේ රක්ෂණ නිමවුම් මිශ්‍රයෙන් උපරිම ඵල ලබාගැනීමට අපේක්ෂා කරමු . රක්ෂණ නිමවුම් මිශ්‍රය ඉලක්කකරගත් වර්ධනය තුලින් සාමාන්‍ය රක්ෂණ අංශය ආක්‍රමණශීලී අයුරින් වෙළඳපොල වෙත ප්‍රවේශ වීමට අවධානය යොමු කරනු ඇත. බාහිර හා අභ්‍යන්තර ආයුඝනකවරුන්ගේ සහාය ඇතිව මිල ප්‍රතිපත්ති තවදුරටත් වෙනස්කම් වලට භාජනය කෙරෙනු ඇත. වෙළඳපොල වෙත ප්‍රවේශවීම පුළුල් කිරීම සහ ඉලක්කගත අලෙවිකරණය තුළින් අපි වඩා ආක්‍රමණශීලී අයුරින් වෙළඳපොල වෙත ප්‍රවේශවීමට අඛණ්ඩව කටයුතු කරන අතර ක්‍රමෝපායික හවුල්කාරීත්වයන් ගොඩනගාගැනීම් ඉදිරි වර්ෂය තුළදී ද ප්‍රධාන භූමිකාවක් ගනු ඇත.

මානව සම්පත් සහ තොරතුරු තාක්ෂණය අනාගතයේ දී ප්‍රධාන ව්‍යාපාරික ධාවකයන් වශයෙන් අප විසින් සලකනු ලබන අතර එබැවින් මෙම අංශයන් තුළ අපගේ ආයෝජනය කිරීම් අඛණ්ඩව සිදු කරන්නෙමු. දේශීය රක්ෂණ කර්මාන්තය සඳහා නවෝත්පාදන සිදු කිරීම සඳහා සහ නැවුම් අත්දැකීම් ගෙන ඒම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් දරන්නෙමු. සමාලෝචිත වර්ෂය පුරාවට ක්‍රියාත්මක කරන ලද සාර්ථක ක්‍රමෝපායන් හේතු කොට ගෙන එළඹෙන වර්ෂවලදී ද අපගේ ආයෝජන තුළින් ලැබෙන ප්‍රතිලාභ තවදුරටත් වැඩි කර ගැනීමටත් එමගින් අපගේ සියළුම පාර්ශවකරුවන් වෙත තිරසාර වටිනාකමක් ලබා දීමටත් හැකියාව ලැබෙනු ඇති බව මම දැඩිව විශ්වාස කරමි.

දීප්ති ලොකුආරච්චි
ප්‍රධාන විධායක නිලධාරී

2017 පෙබරවාරි 09

# HNB ඇෂුවරන්ස් PLC
# මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට, | සමූහය 2016 | සමූහය 2015 | සමාගම 2016 | සමාගම 2015 |
|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 161,362 | 136,279 | 112,151 | 94,107 |
| අස්පෘෂ්‍ය වත්කම් | 60,882 | 45,185 | 60,882 | 45,185 |
| විලම්භිත බදු වත්කම් | 52,922 | 49,394 | - | - |
| මූල්‍ය ආයෝජන | 11,544,575 | 9,751,611 | 9,642,596 | 7,849,625 |
| ආයෝජන - පාලිත සමාගම | - | - | 1,150,000 | 1,150,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 119,941 | 91,992 | 119,941 | 91,992 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 494,726 | 141,354 | 54,814 | 34,269 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 623,294 | 345,916 | 6,805 | 5,592 |
| වෙනත් වත්කම් | 770,674 | 625,985 | 575,676 | 493,571 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භිත වියදම් | 74,951 | 65,935 | - | - |
| මුදල් සහ මුදල් සමානතා | 625,527 | 386,929 | 476,572 | 258,222 |
| **මුළු වත්කම්** | **14,528,854** | **11,640,580** | **12,199,437** | **10,022,563** |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ඉපයීම් | 1,721,675 | 1,174,262 | 1,897,936 | 1,397,806 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | (7,152) | (4,748) | (1,465) | 53 |
| වෙනත් සංචිත | 1,790 | (1,093) | (1,886) | (2,039) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | (191,131) | (56,350) | (191,131) | (56,350) |
| මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය | 2,697,057 | 2,283,946 | 2,875,329 | 2,511,345 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 2,697,057 | 2,283,946 | 2,875,329 | 2,511,345 |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 8,747,856 | 7,007,080 | 8,747,856 | 7,007,080 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 1,921,567 | 1,546,265 | - | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 90,433 | 81,001 | 50,883 | 44,008 |
| වර්තමාන බදු වගකීම | 3,300 | - | - | - |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 287,895 | 131,905 | 39,395 | 37,547 |
| වෙනත් වගකීම් | 780,746 | 590,383 | 485,974 | 422,583 |
| **මුළු වගකීම්** | 11,831,797 | 9,356,634 | 9,324,108 | 7,511,218 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **14,528,854** | **11,640,580** | **12,199,437** | **10,022,563** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 216 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC
## ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සමූහය | | සමාගම | | වෙනස % | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,** | **2016** | **2015** | **2016** | **2015** | සමූහය | සමාගම * |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | | |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 6,656,694 | 5,447,164 | 3,554,078 | 2,788,716 | 22 | 27 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (877,713) | (599,084) | (159,050) | (107,963) | 47 | 47 |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 5,778,981 | 4,848,080 | 3,395,028 | 2,680,753 | 19 | 27 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (181,102) | (122,677) | - | - | 48 | - |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **5,597,879** | **4,725,403** | **3,395,028** | **2,680,753** | **18** | **27** |
| | | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොළී හා ලාභාංශ ආදායම | 1,180,085 | 871,049 | 987,959 | 705,571 | 35 | 40 |
| ශුද්ධ උපලබ්ධි ප්‍රතිලාභය | (29,119) | 30,025 | (22,435) | 22,512 | (197) | (200) |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය | (6,461) | 16,583 | (7,793) | 4,028 | (139) | (293) |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 128,798 | 116,294 | 62,858 | 44,742 | 11 | 40 |
| වෙනත් ආදායම් | 25,024 | 15,201 | 11,017 | 6,273 | 65 | 76 |
| **මුළු වෙනත් ආදායම්** | **1,298,327** | **1,049,152** | **1,031,606** | **783,126** | **24** | **32** |
| | | | | | | |
| **ශුද්ධ ආදායම** | **6,896,206** | **5,774,555** | **4,426,634** | **3,463,879** | **19** | **28** |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ  වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (1,966,759) | (1,984,358) | (387,829) | (299,271) | (1) | 30 |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | 19,114 | (133,431) | (13,848) | 18,776 | (114) | (174) |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (1,708,285) | (1,462,100) | (1,708,285) | (1,462,100) | 17 | 17 |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (1,572,964) | (1,296,185) | (886,845) | (701,809) | 21 | 26 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (922,886) | (699,679) | (748,051) | (544,673) | 32 | 37 |
| වෙනත් රක්ෂණ අදාළ වියදම් | (38,905) | (29,029) | (25,134) | (17,774) | 34 | 41 |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (6,190,685) | (5,604,782) | (3,769,992) | (3,006,851) | 10 | 25 |
| | | | | | | |
| **බදු පෙර ලාභය** | 705,521 | 169,773 | 656,642 | 457,028 | 316 | 44 |
| ආදායම් බදු | (58,108) | 27,571 | (56,512) | (29,383) | (311) | 92 |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **647,413** | **197,344** | **600,130** | **427,645** | **228** | **40** |
| | | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය කරන ලද  හෝ වර්ගීකරණය වියහැකි අයිතම** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (153,476) | (87,480) | (147,913) | (80,350) | 75 | 84 |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද  උපලබ්ධි වූ ලාභය | 14,466 | (19,242) | 11,614 | (20,218) | 175 | 157 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 134,781 | 97,098 | 134,781 | 97,098 | 39 | 39 |
| - ආශ්‍රිත බදු | 1,825 | 1,286 | - | - | 42 | - |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | | | | |
| ප්‍රතිමිනුම් මත ලාභ/අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 2,883 | (2,270) | 153 | (3,216) | 227 | 105 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | 479 | (10,608) | (1,365) | (6,686) | 105 | 80 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 647,892 | 186,736 | 598,765 | 420,959 | 247 | 42 |
| | | | | | | |
| **මුළු ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 647,413 | 197,344 | - | - | 228 - | |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - - | - | |
| **වර්ෂයේ මුළු ලාභය** | 647,413 | 197,344 | - | - | 228 | |
| | | | | | | |
| **මුළු විස්තීරණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 647,892 | 186,736 | - | - | 247 | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 647,892 | 186,736 | - | - | 247 | |
| | | | | | | |
| **කොටසක ඉපයීම** | | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 12.95 | 3.95 | 12.00 | 8.55 | 228 | 40 |
| කොටසක ලාභාංශය (රු.) | - | - | 5.00 | 2.00 | - | 150 |

ඉහත ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 217 හී  විගණනය කරන ලද ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවිය සඳහා පවතින සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,196,546 | 3,590 | 1,177 | 40,748 | 2,413,936 |
| **සුපිරි ලාභ බදු** | - | (31,378) | - | - | - | (31,378) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| - වර්ෂය සඳහා වූ ලාභය | - | 197,344 | - | - | - | 197,344 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (105,436) | - | - | (105,436) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 97,098 | - | - | 97,098 |
| - ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (2,270) | - | (2,270) |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | (8,338) | (2,270) | - | (10,608) |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 197,344 | (8,338) | (2,270) | - | 186,736 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (97,098) | (97,098) |
| **හිමිකරුවන් සමග සිදුවූ, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **- ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| - 2014 වර්ෂය සඳහා වූ ලාභාංශ ගෙවීම් | - | (187,500) | - | - | - | (187,500) |
| - පාලිත සමාගමේ කොටස් නිකුතුවට අදාළ ගණුදෙනු සඳහා වියදම | - | (750) | - | - | - | (750) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (188,250) | - | - | (97,098) | (285,348) |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **1,174,262** | **(4,748)** | **(1,093)** | **(56,350)** | 2,283,946 |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 1,174,262 | (4,748) | (1,093) | (56,350) | 2,283,946 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 647,413 | - | - | - | 647,413 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (137,815) | - | - | (137,815) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 134,781 | - | - | 134,781 |
| - ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 2,883 | - | 2,883 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (2,404) | 2,883 | - | 479 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 647,413 | (2,404) | 2,883 | - | 647,892 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (134,781) | (134,781) |
| **හිමිකරුවන් සමග සිදුවූ, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2015 වර්ෂය සඳහා වූ ලාභාංශ ගෙවීම් | - | (100,000) | - | - | - | (100,000) |
| පාලිත සමාගමේ කොටස් නිකුතුවට අදාළ ගණුදෙනු සඳහා වියදම | - | - | - | - | - | - |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (100,000) | - | - | (134,781) | (234,781) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,721,675 | (7,152) | 1,790 | (191,131) | 2,697,057 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය , වාර්ෂික වාර්තාවේ පිටු අංක 218 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2016 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවිය සඳහා පවතින සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්‍ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 1,189,039 | 3,523 | 1,177 | 40,748 | 2,406,362 |
| සුපිරි ලාභ බදු | - | (31,378) | - | - | - | (31,378) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 427,645 | - | - | - | 427,645 |
| **වර්ෂය සඳහා වු වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (100,568) | - | - | (100,568) |
| - ජීවිත රක්‍ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 97,098 | - | - | 97,098 |
| - ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (3,216) | - | (3,216) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (3,470) | (3,216) | - | (6,686) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 427,645 | (3,470) | (3,216) | - | 420,959 |
| ජීවිත රක්‍ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (97,098) | (97,098) |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2014 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (187,500) | - | - | - | (187,500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (187,500) | - | - | (97,098) | (284,598) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,397,806 | 53 | (2,039) | (56,350) | 2,511,345 |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 1,397,806 | 53 | (2,039) | (56,350) | 2,511,345 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 600,130 | - | - | - | 600,130 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (136,299) | - | - | (136,299) |
| - ජීවිත රක්‍ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 134,781 | - | - | 134,781 |
| - ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 153 | - | 153 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (1,518) | 153 | - | (1,365) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 600,130 | (1,518) | 153 | - | 598,765 |
| ජීවිත රක්‍ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (134,781) | (134,781) |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2015 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (100,000) | - | - | - | (100,000) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (100,000) | - | - | (134,781) | (234,781) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,897,936 | (1,465) | (1,886) | (191,131) | 2,875,329 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම, වාර්ෂික වාර්තාවේ පිටු අංක 219 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා,** | | 2016 | 2015 | 2016 | 2015 |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 705,521 | 169,773 | 656,642 | 457,028 |
| **ගැලපීම්:** | | | | | |
| පොළී ආදායම | | (1,166,369) | (843,579) | (976,943) | (687,104) |
| ලාභාංශ ආදායම | | (13,716) | (27,470) | (11,016) | (18,467) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමාක්ෂය | | 20,107 | 17,226 | 20,107 | 17,226 |
| දේපල පිරියත හා උපකරණ ක්‍රමක්ෂය | | 44,878 | 51,116 | 31,708 | 38,082 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 24,142 | 22,201 | 13,984 | 12,849 |
| ශුද්ධ සාධාරණ අගය මත (ලාභ)/අලාභ | | 6,461 | (16,583) | 7,793 | (4,028) |
| උපලබ්ධි වු ශුද්ධ (ලාභ)/අලාභ | | 29,119 | (30,025) | 22,435 | (22,512) |
| වත්කම් පැවරීම මත උපලබ්ධි නොවු ශුද්ධ ලාභ | | - | (3,523) | - | (3,523) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් (ලාභ)/අලාභ | | 3,763 | (46) | 2,592 | (15) |
| | | (346,094) | (660,910) | (232,698) | (210,464) |
| මෙහෙයුම් වත්කම් වල වෙනස | (අ) | (787,055) | 65,699 | (130,454) | (24,825) |
| මෙහෙයුම් වගකීම් වල වෙනස | (ආ) | 2,447,424 | 1,812,602 | 1,806,015 | 1,533,751 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 1,314,275 | 1,217,391 | 1,442,863 | 1,298,462 |
| ගෙවු පාරිතෝෂිකය | | (11,827) | (14,963) | (8,156) | (11,292) |
| ගෙවු ආදායම් බදු | | - | (1,280) | - | - |
| ආර්ථික සේවා ගාස්තු | | (10,250) | - | - | - |
| ගෙවු සුපිරි ලාභ බදු | | - | (31,378) | - | (31,378) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහ | | 1,292,198 | 1,169,770 | 1,434,707 | 1,255,792 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ආයෝජන සුරැකුම් ශුද්ධ මිලදී ගැනුම් | | (1,937,075) | (1,442,522) | (1,920,005) | (1,294,693) |
| ලද පොළී | | 1,079,377 | 711,684 | 880,938 | 568,571 |
| ලද ලාභාංශ | | 13,625 | 27,198 | 10,858 | 18,467 |
| ආයෝජන පාලිත සමාගම | | - | - | - | (150,000) |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (35,804) | (10,789) | (35,804) | (10,789) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (75,393) | (53,596) | (53,895) | (39,679) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 1,670 | 189 | 1,551 | 146 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (953,600) | (767,836) | (1,116,357) | (907,977) |
| **මුල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (100,000) | (187,500) | (100,000) | (187,500) |
| කොටස් නිකුතුව හා සම්බන්ධ වියදම් - පාලිත සමාගම | | - | (750) | - | - |
| මුල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (100,000) | (188,250) | (100,000) | (187,500) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම** | (ඇ) | 238,598 | 213,684 | 218,350 | 160,315 |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 386,929 | 173,245 | 258,222 | 171,217 |
| මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - පාලිත සමාගම | | - | - | - | (73,310) |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 625,527 | 386,929 | 476,572 | 258,222 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්**

| | 2016 | 2015 | 2016 | 2015 |
|---|---|---|---|---|
| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | | |
| විලම්භිත වියදම් වල වැඩි වීම් | (9,016) | (13,863) | - | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | (27,949) | (20,910) | (27,949) | (20,910) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල (වැඩි වීම්) /අඩු වීම් | (353,372) | 20,906 | (20,545) | (10,823) |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී (වැඩි වීම්) /අඩු වීම් | (277,378) | 18,135 | (1,213) | 1,351 |
| මුළු වෙනත් වත්කම් වල (වැඩි වීම්) /අඩු වීම් | (119,340) | 61,431 | (80,747) | 5,557 |
| **ශුද්ධ මෙහෙයුම් වත්කම් වල වෙනස** | (787,055) | 65,699 | (130,454) | (24,825) |
| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | | |
| අනෙකුත් වගකීම් වල වැඩි වීම් | 175,356 | 79,916 | 63,391 | 82,693 |
| රක්ෂණ ප්‍රතිපාදන – සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | 375,302 | 267,127 | - | - |
| රක්ෂණ ප්‍රතිපාදන – ජීවිත රක්ෂණ වල වැඩි වීම් | 1,740,776 | 1,444,432 | 1,740,776 | 1,444,432 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ – වැඩි වීම් | 155,990 | 21,127 | 1,848 | 6,626 |
| **ශුද්ධ මෙහෙයුම් වගකීම් වල වෙනස** | 2,447,424 | 1,812,602 | 1,806,015 | 1,533,751 |
| **(ඇ) මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල වැඩි වීම්/(අඩු වීම්)** | | | | |
| වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ශුද්ධ අගය | 625,527 | 386,929 | 476,572 | 258,222 |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ශුද්ධ අගය | 386,929 | 173,245 | 258,222 | 97,907 |
| මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම් | 238,598 | 213,684 | 218,350 | 160,315 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 220 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.